*Sri Lanka Journal of Social Sciences* 2015 **38** (1): 1-11
DOI: http://dx.doi.org/10.4038/sljss.v38i1.7382

**REVIEW ARTICLE**

# Rural-urban linkages and theoretical underpinnings of regional development

# ග්‍රාමීය-නාගරික අන්තර් සබඳතා සහ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක පසුබිම

**R. J. M. Uduporuwa**[*]
*Department of Geography and Environmental Management, Faculty of Social Sciences and Languages, Sabaragamuwa University of Sri Lanka, Sri Lanka.*

**Abstract:** Even though rural and urban areas are considered as detached entities in regional development efforts, they are mutually dependent in their development. Rural and urban areas are tied together by various types of rural-urban linkages and the understanding of the reciprocal relationship behind these areas and consideration of this relationship in regional development strategies are very effective in the development of both areas. The main purpose of this article is to discuss rural-urban linkages and the conceptual underpinning of regional development, emphasising how this reciprocal relationship brings positive impact on regional development. Attention will also be drawn to explore the nature of rural-urban linkages in both developed and developing countries. Research papers, books and articles written on this field are reviewed in this article.

Rural and urban areas are absolutely connected to each other in terms of complex linkages such as physical, social, economical, infrastructural, demographical, technical, attitudinal and environmental linkages. The intensity of these linkages vary from region to region, depending on different factors or situations in each region. As studies from different parts of the world show, rural-urban linkages have been strongly established in developed coutries with high rate of urbanisation than developing countries where rural-urban linkages are mostly weak with slow and low rate of urbanisation. A number of studies has been done on rural-urban linkages in Sri Lanka, which has revealed that despite the fact that the country has a large number of small and medium size urban centres, relationships between those towns and their peripheral areas are weak and this weak relationship negatively affects the regional development of Sri Lanka. However, recently established new mega projects in remote areas such as Hambantota by the government and emergence of new marketing trends such as chain supermarkets and their collective systems of rural productions and agreements with farmers by the private sector are much favourable in strengthening the rural-urban relations in Sri Lanka. These new emerging trends are good signs for the regional development of Sri Lanka.

**Keywords :** Rural areas , urban areas, linkages, regional development

**සාරාංශය**

ප්‍රාදේශීය සංවර්ධන ප්‍රයත්නවල දී ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ වෙන් වෙන්ව සැලකුවද සංවර්ධනයේ දී ඒවා පරායත්ත වන බැවින්, මෙම දෙක ම ඒකාබද්ධ කෙරෙන ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශයක් කෙරෙහි අවධානය යොමු කිරීම වඩාත් ඵලදායී ක්‍රමෝපායක් වේ. ග්‍රාමීය ප්‍රදේශ හා නාගරික ප්‍රදේශ, ග්‍රාමීය-නාගරික සබඳතා හරහා එකිනෙක බැඳී පවතින අතර එම අන්තර් සබඳතාවයේ ස්වභාවය පැහැදිලි ව අවබෝධ කර ගැනීම ප්‍රාදේශීය සංවර්ධන සැලැසුම්කරණයේ දී ඉතා ප්‍රයෝජනවත් ය. මෙම අධ්‍යනයෙහි මුඛ්‍ය අරමුණ වන්නේ ග්‍රාමීය-නාගරික සබඳතා හි සංකල්පනාත්මක සන්දර්භය සාකච්ඡා කිරීම හා එමගින් ප්‍රාදේශීය සංවර්ධනයට සිදු වන ධනාත්මක බලපෑම පිළිබඳව විග්‍රහ කිරීම වන අතර ඊට අමතරව සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ග්‍රාමීය-නාගරික සබඳතාවල ස්වභාවය තේරුම් ගැනීමට ද අවධානය යොමු කරනු ලැබේ. මේ සඳහා අදාළ ක්ෂේත්‍රය හා සම්බන්ධ පොත් පත්, පර්යේෂණ පත්‍රිකා සහ ලිපි යොදා ගන්නා ලදී.

ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ භෞතික, ආර්ථික, සමාජ, සේවා පහසුකම්, ප්‍රජාවිද්‍යාත්මක, තාක්ෂණික, ආකල්පමය සහ පාරිසරික ආදි සංකීර්ණ සබඳතා රාශියකින් එකිනෙක හා බැඳී පවතින අතර එම සබඳතා හි තීව්‍රතාවය විවිධ හේතු මත ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. සංවර්ධිත රටවල ඉහළ නාගරීකරණය සමඟ වඩාත් ශක්තිමත් ග්‍රාමීය-නාගරික සබඳතා ගොඩ නැගී ඇති අතර බොහෝ සංවර්ධනය වෙමින් පවතින

[*]jeewani@sab.ac.lk

රටවල ශක්තිමත් ග්‍රාමීය-නාගරික සබඳතා ගොඩ නැගී නැත. ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම ප්‍රමාණ නගර විශාල ප්‍රමාණයක් පවතින නමුදු, මෙම නගර සහ ඒවායේ පර්යන්ත ප්‍රදේශ අතර දුර්වල සබඳතාවයක් පවතින බවත්, දුර්වල සබඳතා ප්‍රාදේශීය සංවර්ධනයට බාධාවක් බවත් විවිධ අධ්‍යයන මගින් පෙන්වා දී ඇත. එහෙත් වර්තමානය වන විට රාජ්‍ය සහ පුද්ගලික අංශයේ දායකත්වයෙන් අරඹා ඇති නව සංවර්ධන ව්‍යාපෘති සහ වෙළෙඳ ප්‍රතිපත්ති ග්‍රාමීය-නාගරික සබඳතා බලගැන්වීම සඳහා ඉතා ම සුභදායී වන අතර එම නව ප්‍රවණතා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සුභ ලකුණු වේ.

## හැඳින්වීම

'ග්‍රාමීය-නාගරික' වශයෙන් පවතින 'බෙදීම' (Rural-urban dichotomy) යුරෝපයේ කාර්මික විප්ලවය සමඟ ඇති වූ වේගවත් නාගරීකරණයත් සමඟ ව්‍යවහාරයට පැමිණියකි. ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල පවතින ව්‍යුහාත්මක ලක්ෂණ පදනම් කරගනිමින් එම ප්‍රදේශ එකිනෙකට වෙනස් වූ ප්‍රදේශ ලෙස නිර්වචනය වූ අතර, ආයෝජන හා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී මෙම ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් සලකා සැලසුම් සකස් කරන ලදී. පසුගිය දශක හයක පමණ කාලය තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල යටත්විජිතකරණය නිසා 'නාගරික ගැති' (Urban bias) සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් සමාජ-ආර්ථික මෙන්ම අවකාශීය වශයෙන් ද නාගරික ප්‍රදේශ වඩා ශක්තිමත් වීම තුළ ග්‍රාමීය ප්‍රදේශ සාපේක්ෂ ව දුර්වල වීමෙන් ප්‍රාදේශීය සංවර්ධන පරතරය වැඩි වන්නට විය.

එහෙත් වර්තමානය වන විට ග්‍රාමීය-නාගරික යන සම්ප්‍රදායික බෙදීම ප්‍රතිපත්ති සැකසීමේදී සහ සංවර්ධන සැලැසුම්කරණයේදී ඉවත් වෙමින් පවතී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු දෙකක් වැදගත් වන බව පෙනේ. එනම් සංවර්ධනය සඳහා වෙළඳපොළ මත පදනම් වන ක්‍රමෝපායන්ට (Market-strategies) මාරු වීමේ ගෝලීය ප්‍රවණතාවය තුළ ග්‍රාමීය-නාගරික සබඳතා ප්‍රාදේශීය සංවර්ධනයේ මූලික සාධකයක් ලෙස සැලකීම සහ ගෝලීයකරණය හරහා මෙම ප්‍රදේශ අන්‍යෝන්‍ය වශයෙන් වඩා සමීප වීමය. ඒ අනුව තව දුරටත් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් සලකා ඒ මත ක්‍රියා කිරීම නොව ඒවා අතර පවතින අන්තර් පරායත්තතාවය හඳුනා ගෙන ඒ මත ක්‍රියා කිරීමේ වැදගත්කම හඳුනා ගෙන ඇත. වර්තමානය වන විට සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වඩා සාර්ථක ප්‍රවේශයක් අනුගමනය කිරීමේදී ග්‍රාමීය-නාගරික සබඳතා වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම කෙරෙහි ප්‍රබල අවධානයක් යොමු කරමින් සිටී.

ග්‍රාමීය-නාගරික ප්‍රදේශවල පවතින අන්තර් සම්බන්ධතා පිළිබඳව අවකාශීය සංවර්ධන න්‍යායන් මගින් ඉදිරිපත් කොට තිබුණ ද ඒ පිළිබඳ ව සෘජු ලෙස විවෘත කතිකාවක් ආරම්භ වන්නේ 1980 දශකයෙන් පසුව ය. මෑත කාලීන විද්වතුන්, පර්යේෂකයින්, ප්‍රාදේශීය හා නාගරික සැපයුම්කරුවන් විසින් ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශයක් ලෙස එහි පවතින විභවතාව පිළිබඳ ව අදහස් දක්වා ඇත. බොහෝ පර්යේෂකයින් සංකල්පනාත්මක ව මෙන් ම ආනුභවික අධ්‍යයනයන් මගින් අවධාරණය කරනු ලබන්නේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර අන්තර් පරායත්තතාවයක් පවතින බැවින් ප්‍රාදේශීය සංවර්ධනයේදී මෙම අංශ දෙකම සම්බන්ධ කෙරෙන ප්‍රවේශයක් විනා 'ග්‍රාමීය සංවර්ධනය' හෝ 'නාගරික සංවර්ධන' වශයෙන් වෙන් වූ ඒක පාර්ශවීය සංවර්ධන ප්‍රවේශ තව දුරටත් වලංගු නොවන බව යි. විශේෂයෙන් ම එක්සත් ජාතීන්ගේ ජනාවාස පිළිබඳ ආයතනය (UN-Habitat) දක්වන ආකාරයට ප්‍රාග්ධන ගලනය, පුද්ගල භාණ්ඩ ගලනය, අදහස්, ආකල්ප, තාක්ෂණය හා නවෝත්පාදන ගලනය හරහා ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ ඒකාබද්ධ වී ඇති බැවින් මෙම ප්‍රදේශ දෙකෙහි ම සංවර්ධනය සඳහා 'ග්‍රාමීය-නාගරික සංවර්ධනය ප්‍රවේශය' (Rural-urban development approach) යනුවෙන් පිළිගන්නා ලද නව ප්‍රවේශයක් අනුගමනය කළ යුතු බව යි. එම ආයතනය තව දුරටත් පවසන පරිදි ජාත්‍යන්තර සංවර්ධන න්‍යාය පත්‍රය විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසාර සංවර්ධනය හා රැකියා ජනනය කිරීමට 'ග්‍රාමීය-නාගරික සංවර්ධනය ප්‍රවේශයට' ඇති හැකියාව පිළිබඳ ව අධ්‍යයන කරමින් පවතී. ඒ අනුව, සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධනයෙන් අඩු ප්‍රදේශවල සංවර්ධනය වේගවත් කිරීම සඳහා ග්‍රාමීය-නාගරික සබඳතා වර්ධනය කිරීම ක්‍රමෝපායක් ලෙස භාවිතා කරනු ලබයි (Okpala, 2003).

විවිධ විද්වතුන් සහ පර්යේෂකයන් ආනුභවික අධ්‍යයන ඔස්සේ පෙන්වා දෙන පරිදි පසුගිය දශක කිහිපය පුරා කෙතරම් ක්‍රමෝපායන් ක්‍රියාත්මක කළ ද සංවර්ධනය වෙමින් පවතින රටවල සමාජ-ආර්ථික සංවර්ධනයෙන් දුර්වල ප්‍රදේශ පවතී. හර-පරිධි ව්‍යුහය (Core-periphery structure) ඉතාම ප්‍රබල ලෙස වර්ධනය වී ඇති ශ්‍රී ලංකාවේ ද සමාජ-ආර්ථික සංවර්ධනයෙන් දුර්වල ප්‍රදේශ පවතින බව පැහැදිලි කරුණකි. ඒ අනුව විශාල ග්‍රාමීය ජනතාවක් හා අඩු නාගරික ජනතාවක් සිටින ශ්‍රී ලංකාව වැනි රටකට ප්‍රාදේශීය සංවර්ධනයේ පරතරය අඩුකර ගැනීමෙහිලා ප්‍රතිපත්ති සම්පාදනයේදී හා සැලැසුම් කිරීමේදී ග්‍රාමීය-නාගරික සබඳතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා අවශ්‍ය වේ. මේ සඳහා ග්‍රාමීය ප්‍රදේශ සහ නාගරික ප්‍රදේශ අතර පවතින අන්තර් පරායත්තතාවය තේරුම් ගැනීම ප්‍රාදේශීය සංවර්ධනයේදී කෙතරම් අදාළ ද යන්න අවබෝධ කර ගැනීම ප්‍රයෝජනවත් ය. එබැවින් මෙම අධ්‍යයනයෙහි කේන්ද්‍රීය අරමුණ වන්නේ ග්‍රාමීය-නාගරික සබඳතා ප්‍රවේශයෙහි සංකල්පනාත්මක සන්දර්භය සාකච්ඡා කිරීම හා එමගින් ප්‍රාදේශීය සංවර්ධනයට විය හැකි ධනාත්මක බලපෑම (Positive effects) පිළිබඳ ව විග්‍රහ කිරීම යි.

මෙම අධ්‍යයනය පූර්ණ වශයෙන් ම ද්විතීයික මූලාශ්‍ර මත පදනම් වේ. මෙම විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලිය වී ඇති ලිපි ලේඛන මේ සඳහා භාවිත කරන ලදී. ග්‍රාමීය-නාගරික සබඳතා හි සංකල්පනාත්මක පසුබිම පිළිබඳ ව සාකච්ඡා කිරීමේදී සංවර්ධනය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති විවිධ සංකල්පනාත්මක හා න්‍යායාත්මක කරුණු ද ඒවා සම්බන්ධයෙන් විවිධ විද්වතුන් සහ පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරන ලද මතවාද, සාකච්ඡා සහ විශ්ලේෂණ ආශ්‍රයෙන් ලිය වී ඇති තොරතුරු ද භාවිත කරන ලදී. ලෝකයේ විවිධ රටවල ග්‍රාමීය-නාගරික සබඳතාවල ස්වභාවය පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා කරන ලද පර්යේෂණවලින් ඉදිරිපත් කොට ඇති තොරතුරු ද උපයෝගී කර ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ


ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා මෑත කාලීන ව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ග්‍රාමීය-නාගරික සබඳතා සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණ අළලා ලියවුණු පොත්පත්, පර්යේෂණ පත්‍රිකා සහ ලිපි යොදා ගන්නා ලදී. මේ අනුව මෙම අධ්‍යනය මගින් සංවර්ධන සංකල්ප, න්‍යායාත්මක අදහස් හා පර්යේෂණ ආදිය උපයෝගී කොට ගෙන අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සාර්ව මට්ටමින් කරුණු විග්‍රහ කිරීමක් කොට ඇත.

## ග්‍රාමීය-නාගරික අන්තර් සබඳතා

ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ වෙන් වෙන්ව සැලකීම බොහෝ අවස්ථාවල දී සිදුවන්නකි. මෙම පාරිභාෂිත වචන දෙකෙන් කිසියම් බෙදීමක් (Dichotomy) හැඟැවෙන අතර එහි අවකාශීය මෙන් ම ආංශීය මානයක් (Spatial and sectoral dimension) ද වෙයි. ග්‍රාමීය ප්‍රදේශවල මූලික ආර්ථික කටයුත්ත කෘෂිකර්මය වන අතර නාගරික ප්‍රදේශවල මූලික ආර්ථික කටයුත්ත වන්නේ කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සහ සේවා සැපයීම යි. මෙම ප්‍රදේශ දෙක අතර සබඳතාව ගොඩ නැගෙන්නේ ග්‍රාමීය ජනතාව නාගරික භාණ්ඩ සහ සේවා මත යැපීමත් නාගරික ජනතාව ග්‍රාමීය සම්පත් සහ නිෂ්පාදනයන් මත යැපීමත් නිසා ය.

ග්‍රාමීය ප්‍රදේශවලින් නාගරික ප්‍රදේශ වෙන් කොට හඳුනා ගැනීම විවිධ පරමාර්ථ සඳහා අවශ්‍ය වේ. එහෙත් මෙම ප්‍රදේශ වෙන් කොට හඳුනා ගැනීම සඳහා ලෝකයේ සියලු ම රටවල් පිළිගන්නා ලද පොදු වූ නිර්ණායක නැත. එක් එක් රටවල් සිය අභිමතාර්ථය පරිදි තීරණය කරගන්නා ලද නිර්ණායක භාවිත කරමින් නාගරික ප්‍රදේශ හඳුනා ගනු ලැබේ. බොහෝ රටවල් තමන් විසින් තීරණය කරගන්නා ලද කිසියම් ජනසංඛ්‍යාවක් මේ සඳහා භාවිත කරනු ලබන අතර, ඇතැම් රටවල් ජන ඝනත්වය, ද්විතියික සහ තෘතීයික ආර්ථික කටයුතුවල නියුක්ත ජන සංඛ්‍යාව, පරිපාලන හෝ පළාත් පාලන මායිම් වැනි නිර්ණායකවලින් එකක් හෝ කිහිපයක් භාවිත කරයි. ශ්‍රී ලංකාවේ පළාත් පාලන මායිම් නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා භාවිත කරනු ලැබේ.

නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යුහාත්මක ලක්ෂණ අනුව මෙම ප්‍රදේශ එකිනෙකට වෙන්ව හඳුනා ගත්ත ද ඒවා නිරන්තරයෙන්ම එකිනෙකට බද්ධ ව ක්‍රියා කරයි. Jefferson (1931) පවසන පරිදි නගරවලට තනිවම වර්ධනය විය නොහැකි අතර ග්‍රාමීය ප්‍රදේශවල අනුග්‍රහය ඒ සඳහා අවශ්‍ය වේ. Douglas (1998) පවසන්නේ ග්‍රාමීය පුද්ගලයකුගේ දෛනික ජීවිතයට ග්‍රාමීය හා නාගරික යන අවශ්‍යතා දෙකම ඇතුළත් බව ය. ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳ ව සිදු කරන ලද පර්යේෂණ (Bhooshan, 1986; Bryceson & Jamal, 1997; Saint & Goldsmith, 1980) මගින් පෙන්වා දෙන්නේ ආංශීය සබඳතා එනම්, නාගරික වැසියන් ග්‍රාමීය කෘෂිකාර්මික නිෂ්පාදන මත යැපීමත් ග්‍රාමීය වැසියන් තම ආදායම සඳහා නගරය භාවිතයට ගැනීමත්, අප සිතනවාට වඩා වැඩි බව යි. ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ඇති මෙම ආංශීය සබඳතාව තුළ බහුමානීය අවකාශීය සබඳතා ද පවතී. එනම් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන්නන්හට ආදායම් ඉපැයීම ඇතුළු නාගරික අවශ්‍යතා රාශියක් පවතී. ග්‍රාමීය ජනතාව ගම්වල ජීවත්වෙමින් ජීවිතයේ විවිධ අවශ්‍යතා ලබා ගැනීම සඳහා (සිල්ලර බඩු, ඇඳුම් පැළැඳුම් හා ගෘහ භාණ්ඩ මෙන්ම අධ්‍යාපනික, සෞඛ්‍යය, පරිපාලන හා විනෝදාත්මක සේවා) හා රැකියා සඳහා ද දෛනික ව නගරයට පැමිණෙති. නගරය ග්‍රාමීය පාරිභෝගික අවශ්‍යතා සහ රැකියා අවස්ථා සපයයි. එමෙන්ම ග්‍රාමීය ජනතාවගේ කෘෂි නිෂ්පාදනය අලෙවි කර ගැනීමේදී වෙළෙඳපොළ වන්නේ ද නගරය යි (රූපය 01).




**රූපය 01:** ග්‍රාමීය-නාගරික සබඳතාව
මූලාශ්‍රය : Mangiza, 2005 ඇසුරිනි.

Mushi (2003) පවසන පරිදි ග්‍රාමීය ප්‍රදේශ හා නාගරික ප්‍රදේශ අතර මෙලෙස ඇතිවන සබඳතාව ග්‍රාමීය ප්‍රදේශවලට පමණක් නොව නාගරික මධ්‍යස්ථානවලට ද දැඩි ලෙස බලපානු ලැබේ. ග්‍රාමීය නිෂ්පාදනවල මිළ පහළ යාම හෝ ග්‍රාමීය නිෂ්පාදන අඩුවීම ග්‍රාමීය ප්‍රදේශවල දරිද්‍රතාවයට බලපානවා පමණක් නොව නාගරික ප්‍රදේශවලින් සපයනු ලබන භාණ්ඩ හා සේවාවලට පවතින ඉල්ලුම ද පහත බැසීමට හේතු වේ. එමෙන්ම ඔහු දක්වන පරිදි, නාගරික දරිද්‍රතාවය ඉහළ යාම තුළින් හැඟෙන්නේ ග්‍රාමීය සංක්‍රමණිකයන්ට නාගරික ප්‍රදේශවල පවතින රැකියාවල හිඟ බවයි. මෙමඟින් නාගරික ප්‍රදේශවල සිට ග්‍රාමීය ප්‍රදේශවලට සිදුවන ආදායම ගලායාම අඩුවන අතර ග්‍රාමීය නිෂ්පාදනවලට පවතින ඉල්ලුම ද අඩුවේ. එමෙන්ම, ග්‍රාමීය ජනතාව උපයන්නන් නොව යැපෙන්නන් පිරිසක් බවට ද පත් වේ (Mushi, 2003).

මේ අනුව ග්‍රාමීය ප්‍රදේශ හා නාගරික ප්‍රදේශ අතර පවතින අන්තර් සම්බන්ධතාවයේ ස්වභාවය පැහැදිලි වේ. මෙම අන්තර් සම්බන්ධතාවය තුළ කෘෂිකාර්මික ද්‍රව්‍ය ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික වෙළඳපොළට ගලායාම සහ නිමිභාණ්ඩ නාගරික ප්‍රදේශවල සිට ග්‍රාමීය ප්‍රදේශවලට ගලා යාම, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල සිදුවන දෛනික හෝ කාලීන සංචලතාවය, තාක්ෂණය හා තොරතුරු ගලායාම හා මුල්‍යමය ගැලීම් ආදී සංකීර්ණ ක්‍රියාවලීන් රාශියක් පවතී. මේ තුළින් ගොවියා හා වෙළෙඳුන් අතර මෙන්ම භාණ්ඩ නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් අතර ද දෛනිකව හුවමාරු සබඳතා ඇති වේ. මෙලෙස පුද්ගලික අවශ්‍යතා මත ගම හා නගරය සමඟ දෛනික ව සිදුවන භාණ්ඩ හා සේවා හුවමාරුව අඛණ්ඩ ව පැවතීම එම ප්‍රදේශයේ ගුණක ඵල (Multiplier effects) ඇති කරමින් ප්‍රාදේශීය වර්ධනයට දායකවේ.

## ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳ න්‍යාය සහ සංකල්ප

නාගරික මධ්‍යස්ථාන හා ඒවායේ පර්යන්ත (ග්‍රාමීය) ප්‍රදේශ අතර පවතින සම්බන්ධතාව පිළිබඳ ව විවිධ දෘෂ්ටිකෝණයන් ගෙන් සාකච්ඡා කෙරෙන සිද්ධාන්ත කිහිපයකි. මෙම සිද්ධාන්ත පොදුවේ සලකා බලන විට පෙනී යන්නේ මෙම සිද්ධාන්ත වඩාත් 'නාගරිකවාදී' දෘෂ්ටියකින් ඉදිරිපත් වී ඇති අතර, ඒවා ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාවයේ ස්වභාවය තේරුම් ගැනීමට වඩා අවකාශීය ස්ථානගත වීමේදී සහ කාර්යයමය සංකේන්ද්‍රණය සිදු වීමේදී පර්යන්ත ප්‍රදේශවල පවතින බලපෑම පිළිබඳව අධ්‍යයනය කරනු ලැබූ ඒවා බව යි. මේ සම්බන්ධයෙන් ආනුභාවික අධ්‍යයනයක් හරහා මුලින් ම ප්‍රවේශයක් ඉදිරිපත් කරනු ලබන්නේ von Thünen (1866) විසිනි. ඔහුගේ මූලික පරමාර්ථය වන්නේ නාගරික වෙළෙඳපොළ මත පදනම් ව විවිධ කෘෂිකාර්මික භූමි පරිභෝගයන් අවකාශීය වශයෙන් ස්ථානගතවන ආකාරය ඒක කේන්ද්‍රික වෘත්ත න්‍යායක් ඇසුරින් (Co-centric ring theory) විග්‍රහ කිරීම යි. මෙම සිද්ධාන්තය මත පදනම් ව Cristaller (1933) විසින් කේන්ද්‍රස්ථාන න්‍යාය (Central place theory) ඉදිරිපත් කරන ලද අතර එහි මුඛ්‍ය අරමුණ වූයේ සේවා මධ්‍යස්ථාන ස්ථානගත වීමේ ස්වභාවය සහ ධුරාවලිය පැහැදිලි කිරීම යි. එමෙන්ම Perroux (1950), Myrdal (1957), Hirschman (1958), Hagerstrand (1953), Johnson (1970), Rondinelli & Ruddle (1978), Friedman & Douglas (1979) විසින් ඉදිරිපත් කරන ලද න්‍යායයන් ද වඩාත් නාගරිකවාදී ප්‍රවේශයක් පසුබිම් කරගෙන ඇති අතර ඒවා මඟින් නාගරික මධ්‍යස්ථානවල අවකාශීය ස්ථානගතවීම ග්‍රාමීය ප්‍රදේශවල වර්ධනයට හේතුවන ආකාරය පෙන්වා දී ඇත. ඒ අනුව ලෝකයේ සමහර රටවල් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා නාගරික මධ්‍යස්ථානවල විශේෂ විභවතාවයක් දකින ලද අතර වඩාත් නාගරික ගැති ප්‍රතිපත්ති අනුගමනය කරන ලදී. එහෙත් පසු කාලීන ව Rondinelli (1982,1983,1984a සහ 1984b) Hardoy & Satterthwaite (1986) විසින් කරන ලද පර්යේෂණවලින් පෙන්වා දී ඇත්තේ, Perroux (1950) විසින් ඉදිරිපත් කළ වර්ධන ධ්‍රැව සංකල්පය (Growth pole) මත පදනම් වෙමින් ක්‍රියාත්මක කළ සංවර්ධන ක්‍රමෝපායවලින් පැතිරීමේ ඵලවලට (Spread effect) වඩා පිළිසෝදා ඵල (Back-wash effect) වැඩි වීම හේතු කරගෙන කෘෂි පදනම මත සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය ප්‍රදේශ දුර්වල වී ඇති බව යි.

එමෙන්ම 1950 සහ 1960 දශකවල ප්‍රාදේශීය සංවර්ධන සැලැසුම්කරණයේ දී ඉතා ජනප්‍රිය මතයක් වූයේ කුඩා හා මධ්‍ය පරිමාණ නගර ග්‍රාමීය සංවර්ධනයේදී ධනාත්මක කාර්ය භාරයක් ඉටු කරන බවයි. කුඩා හා මධ්‍ය පරිමාණ නගරවලින් සංවර්ධනය කාන්දු කිරීමේ මෙම දෘෂ්ටියට වඩාත් ම බලපාන ලද්දේ Rondinelli & Ruddle (1978) විසින් ඉදිරිපත් කරන ලද ග්‍රාම සංවර්ධනයේදී නාගරික අංශයේ කෘත්‍යය (Urban function in rural developmet) යන සිද්ධාන්තය යි. මෙහිදී ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අවකාශීය වශයෙන් ඒකාබද්ධ වූ සමතුලිත නාගරික ධුරාවලියක් ස්ථාපිත කිරීම සංවර්ධන ප්‍රතිපත්තිවල මූලික අභිප්‍රාය විය. මෙම ප්‍රවේශය බොහෝ රටවල ප්‍රාදේශීය සංවර්ධනයේ දී යොදා ගත් නමුදු පසුකාලීන ව කරන ලද ආනුභවික අධ්‍යයන පෙන්වා දී ඇත්තේ කුඩා හා මධ්‍ය පරිමාණ නගර ග්‍රාමීය දුප්පතුන් සූරාකමින් ඔවුන් දරිද්‍රතාවයට ඇද දමන බව ය (Southall, 1979). ඒ අනුව 1970 දශකය පමණ වනවිට නගර වර්ධනය යනු කෘෂිකර්මය නොසලකා හරින මෙන්ම ඌන සංවර්ධනයට මග පාදන 'පරපෝෂිත ක්‍රියාවලියක්' (Parasitic process) ලෙස පෙන්වා දෙන ලදී.

මෙලෙස සංවර්ධන ක්‍රියාවලියේදී නාගරික කේන්ද්‍රිත සිද්ධාන්ත මත පදනම් වූ ක්‍රමෝපායන් ප්‍රායෝගිකත්වයේ දී අසාර්ථක වීම වඩාත් ග්‍රාමීය කේන්ද්‍රිත ක්‍රමෝපායන් කෙරෙහි යොමු වීමට හේතුවක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 'ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්' (Integrated rural development projects) වඩාත් යෝග්‍ය ක්‍රමෝපායන් ලෙස පිළිගන්නා ලදී. මෙම ප්‍රවේශය යටතේ 'කෘෂිකාර්මික වෙනස' කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ අතර නාගරික සංවර්ධනය කෙරෙහි ඉතා අල්ප අවධානයක් යොමුවිය (Escobar, 1995).

එහෙත් මෙම ආංශීය සංවර්ධන ක්‍රමෝපායන් මඟින් ඇති වූ අසතුටුදායක ප්‍රතිඵල තුළින් ලෝකයේ බොහෝ රටවල් විසින් අවබෝධ කරගත් සත්‍යය වන්නේ ඇතැම් අවස්ථාවලදී ග්‍රාමීය ප්‍රදේශ හා නාගරික ප්‍රදේශ වෙන් වෙන් ව සලකා කටයුතු කළ ද ප්‍රාදේශීය සංවර්ධනයේදී ග්‍රාමීය-නාගරික බෙදීම නොව ග්‍රාමීය-නාගරික සබඳතාව කෙරෙහි අවධානය යොමු කළ යුතු බව යි. ඒ අනුව වර්තමානය වන විට ලෝකයේ බොහෝ

රටවල් නාගරික කේන්ද්‍රිත හෝ ග්‍රාමීය කේන්ද්‍රිත සංවර්ධන ප්‍රවේශවලින් බැහැරව මෙම ප්‍රදේශ දෙකෙහිම අන්‍යෝන්‍ය වශයෙන් සංවර්ධනයට හේතුවන මධ්‍යස්ථ ප්‍රවේශයක් වශයෙන් ග්‍රාමීය-නාගරික සබඳතා වර්ධනය කිරීම කෙරෙහි විශ්වාසය තබා ඇත. එයට හේතුව වන්නේ ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීම සඳහා එහි පවතින විභවතාව තේරුම් ගැනීම යි.

## අන්තර් සබඳතා සහ ප්‍රාදේශීය සංවර්ධනය

ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර පවතින සබඳතා සංකීර්ණ සබඳතා වේ. ඒවා නිශ්චිතව ම වර්ගීකරණය කිරීම අපහසු ය. එහෙත් තමා විග්‍රහ කරනු ලබන දෘෂ්ටිකෝණයට ගැලපෙන පරිදි පර්යේෂකයින් (Rondinelli, 1985; Kaur, 1995; Mushi, 2003) විසින් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර පවතින සංකීර්ණ සබඳතා වර්ගීකරණයට ලක් කොට තිබේ. ඒවා අධ්‍යයනය කරමින් මෙම විග්‍රහයට අවශ්‍ය පරිදි වර්ගීකරණය කොට ඒවා පහත වගුව 01 හි දක්වා ඇත.

**වගුව 01:** ග්‍රාමීය නාගරික සබඳතා වර්ගීකරණය

| සබඳතාව (Linkage) | ක්‍රියාත්මක වන ආකාරය (Manifested in) |
|---|---|
| භෞතික (Physical linkages) | මාර්ග පද්ධතිය (මහා මාර්ග, දුම්රිය හා ජල මාර්ග) |
| ආර්ථික (Economic linkages) | නිෂ්පාදන සබඳතා, වෙළෙඳ සබඳතා, මූල්‍යමය සබඳතා |
| සේවා පහසුකම් (Service delivery linkages) | අධ්‍යාපනය, සෞඛ්‍ය, පරිපාලන සහ විනෝද කටයුතු |
| ප්‍රජා විද්‍යාත්මක (Population movement linkage ) | දෛනික හෝ කාලීන සංචලතාව /සංක්‍රමණ |
| තාක්‍ෂණික (Technical linkages) | තාක්‍ෂණය, විදුලිය, සන්නිවේදනය, |
| සමාජ (Social linkages) | ප්‍රතිමෝදක කටයුතු, විවාහ හා ඥාති සබඳතා, සමාජීය කටයුතු |
| ආකල්පමය (Ideological linkages) | තොරතුරු ලබා ගැනීම, ගුවන් විදුලිය, රූපවාහිනී, පොත් හා වෙනත් ලිඛිත මාධ්‍ය |
| පාරිසරික (Environmental linkages) | භූමිය, ජලය |

මූලාශ්‍ර: Rondinelli (1985), Kaur (1995), Mushi (2003)

### භෞතික සබඳතා

ප්‍රදේශ අතර අවකාශීය ඒකාබද්ධතාව (Spatial integration) ප්‍රාදේශීය සංවර්ධනයේදී ඉතා තීරණාත්මක සාධකයකි. ප්‍රදේශ අතර අවකාශීය ඒකාබද්ධතාවය ඇති කරනු ලබන්නේ භෞතික සබඳතා හරහා ය. භෞතික සබඳතාවල ස්වභාවය අනෙකුත් සියලු සබඳතාවල තීව්‍රතාවය කෙරෙහි බලපානු ලැබේ. මාර්ග ජාලය භෞතික සබඳතා ඇති කරනු ලබන මාධ්‍ය වේ. මිනිසා විසින් සකස් කරන ලද ප්‍රවාහන ජාලය එනම් මහා මාර්ග, ජල මාර්ග හා දුම්රිය මාර්ග අවකාශීය සංවර්ධනය සඳහා ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. දියුණු කරන ලද කාර්යක්‍ෂම මාර්ග පද්ධතියක් තුළින් ගමන් කිරීමේදී ගතවන කාලය හා ප්‍රවාහන පිරිවැය අඩුවේ. භාණ්ඩ හා පුද්ගල සංචලතාවය වැඩිවන විට වෙළෙඳපොළ ප්‍රසාරණය වේ. ආයෝජන ඉහළ යයි. අධ්‍යාපන අවස්ථා පුළුල් වේ. සන්නිවේදනය දියුණු වී සේවා සපයනු ලබන ප්‍රදේශ වැඩි වේ. දුර්වල ප්‍රවාහන පද්ධතියක් පැවතීම අඩු සංචලතාවයට, කෘෂිකාර්මික නිෂ්පාදන දේශීය වෙළඳපොළට පමණක් සීමා වීමට හා අඩු කාර්මීකරණයට හේතු වේ. එබැවින්, දියුණු ප්‍රවාහන පද්ධතියක් පැවතීම සියලු ග්‍රාමීය හා නාගරික සබඳතා තීව්‍ර කිරීම කෙරෙහි බලපානු ලැබේ.

### ආර්ථික සබඳතා

ප්‍රාදේශීය සංවර්ධනය යනු ආර්ථිකය වර්ධනය වීමේ සංසිද්ධිය යි. (Friedmann,1966), ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ ආර්ථික පදනම වශයෙන් එකිනෙකට වෙනස් වුව ද ඒ මත ඇති-වන අන්තර් සබඳතා ප්‍රාදේශීය සංවර්ධනයේ දී ඉතා වැදගත් වේ. ශක්තිමත් ආර්ථික සබඳතා හරහා භූගෝලීය වශයෙන් ප්‍රදේශ ඒකාබද්ධ වන අතර දුර්වල ආර්ථික සබඳතා ප්‍රදේශ හුදකලා කිරීමට හේතු වේ. ආර්ථිකමය වශයෙන් පවතින සබඳතා අංශ තුනකින් හඳුනා ගත හැකිවන අතර ඒවා පහත පරිදි වේ.

නිෂ්පාදන සබඳතා :

ප්‍රාදේශීය සංවර්ධනයට නිෂ්පාදන සබඳතාවල වැදගත්කම අංශ කිහිපයකින් සලකා බැලිය හැකිය. එක් අතකින් නිෂ්පාදන කර්මාන්තයක් යනු ප්‍රාග්ධනය, තාක්‍ෂණය, ශ්‍රමය, ස්වභාවික සම්පත් ආදී ග්‍රාමීය හා නාගරික අවශ්‍යතා දෙක ම එකිනෙකට බැඳුනු ජාලයක් වන අතර ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ දෙකෙහි ම වර්ධනයට නිෂ්පාදන සබඳතා වැදගත් වේ. එමෙන්ම, නාගරික ප්‍රදේශ මඟින් ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය කෘෂි උපකරණ නිෂ්පාදනය හෝ අලෙවිය සිදු කරනු ලබන අතර ග්‍රාමීය ප්‍රදේශ මඟින් නාගරික නිෂ්පාදන කර්මාන්ත සඳහා අමු ද්‍රව්‍ය සපයනු ලැබේ.

වෙළඳපොළ සබඳතා :

වෙළඳපොළ සබඳතා යනු භාණ්ඩ හුවමාරුව යි. නිෂ්පාදන භාණ්ඩ හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් ග්‍රාමීය ප්‍රදේශ හා නාගරික ප්‍රදේශ එකිනෙකට වෙළඳපොළ වශයෙන් ක්‍රියා කරයි. වෙළඳපොළ සබඳතා කෙරෙහි ජනතාවගේ ආදායම, පරිභෝජන රටාව, භාණ්ඩ අලෙවිය, මූල්‍ය ගණුදෙනු ආදිය ඉතා වැදගත් වේ. Johnson (1970) පෙන්වා දෙන ආකාරයට වෙළඳපොළ සබඳතා යනු කෘෂිකර්මය වාණිජකරණය කිරීම, නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම, හුවමාරු කටයුතු ප්‍රසාරණය කිරීම සහ අවසානයේදී ආර්ථික වර්ධනය කෙරෙහි බලපානු ලබන ප්‍රධාන බලවේග වේ. 'වෙළඳපොළ' යන වචනය විකුණුම්කරුවන් හා ගැණුම්කරුවන් හමුවන ස්ථානය ලෙස අර්ථකථනය කරනු ලැබේ. මෙම හුවමාරුව බොහෝ විට නාගරික මධ්‍යස්ථානවල සිදුවන අතර කෙතරම් දුරකට ග්‍රාමීය ජනතාව නගර සමඟ ආර්ථික සබඳතා පවත්වනවා ද යන්න වෙළඳපොළ විශ්ලේෂණයක් (Market centre analysis) මගින් අවබෝධ කරගත හැකිය.

මුල්‍යමය සබඳතා ඃ

ආදායම් ගලනය, මුල්‍ය කටයුතු හා ප්‍රාග්ධන ගලනය යනාදිය මුල්‍යමය සබඳතා ලෙස වැදගත් වේ. නාගරික මධ්‍යස්ථානවල පිහිටි බැංකු හා වෙනත් මුල්‍ය ආයතන ග්‍රාමීය ජනතාවට අවශ්‍ය ණය ලබා ගැනීමට පහසුකම් සපයන අතරම ඉතිරි කිරීම සඳහා පොළඹවනු ලබයි. මෙය පුද්ගලික මෙන්ම ප්‍රාදේශීය වර්ධනයට ද හේතු වේ.

**සේවා පහසුකම් පිළිබඳ සබඳතා**

සේවා පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව ප්‍රාදේශීය සංවර්ධනයට අවශ්‍ය තවත් වැදගත් සාධකයකි. විශේෂයෙන් ම පුද්ගලයෙකුගේ ජීවිතයේ ගුණාත්මක වර්ධනය සඳහා මෙය ඉතා වැදගත් ය. ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍යය, අධ්‍යාපනික අවශ්‍යතා, පරිපාලන සහ විනෝදාත්මක අවශ්‍යතා සඳහා නගර මධ්‍ය කේන්ද්‍ර ලෙස ක්‍රියා කරනු ලබයි.

**ප්‍රජාවිද්‍යාත්මක සබඳතා**

ප්‍රජාවිද්‍යාත්මක වශයෙන් ද ග්‍රාමීය ප්‍රදේශ හා නාගරික ප්‍රදේශ අතර විශාල සබඳතාවයක් ඇත. මෙම ප්‍රදේශ දීර්ඝ කාලයක් තුළදී ග්‍රාමීය-නාගරික සංක්‍රමණ හරහා බැඳී පවතී. සාම්ප්‍රදායික මෙන්ම නව සම්භාව්‍යවාදී ප්‍රවේශවල විස්තර කෙරෙන පරිදි තල්ලු කිරීමේ හා ඇද ගැනීමේ (Push and pull factors) සාධක මත සංක්‍රමණ තීරණය වේ. මුල් කාලීනව ගමෙන් තල්ලු කළ ජනයා නගරයෙන් ඇද ගත් අතර මෑතක සිට ප්‍රධාන නාගරික මධ්‍යස්ථානවල එහි ප්‍රතිවිරුද්ධ දිශාව ක්‍රියාත්මක වෙමින් පවතී.

දෛනික සංචලතාවය ද ග්‍රාමීය-නාගරික සබඳතාව පෙන්නුම් කරන සාධකයකි. කිසියම් ප්‍රදේශයක දෛනික සංචලතාවයට ආර්ථික සහ සමාජීය සේවාවන් ලබා ගැනීමේ හැකියාව, ඉහළ වැටුප්, අධ්‍යාපනික අවස්ථා, දුර ප්‍රමාණය, ගමන් වියදම් සහ ගමනේ පහසුව යනාදී කරුණු බලපානු ලබයි. විශේෂයෙන්ම රටක කුඩා හා මධ්‍ය පරිමාණ නාගරික මධ්‍යස්ථානවල මෙම පහසුකම් පවතින්නේ නම් ග්‍රාමීය ජනතාව එම නගර සමඟ පවතින සම්බන්ධය වැඩි වේ. මෙම ප්‍රදේශවල ආර්ථික සහ සේවා පහසුකම්වල සංකේන්ද්‍රණය වැඩි වන්නේ නම් එමඟින් ඉහළ සංචලතාවයක් ඇති කරනු ලබයි. දෛනික සංචලතාවය වැඩි වීම යනු අනෙකුත් සියලු සම්බන්ධතා තීව්‍ර වීමකි.

**තාක්‍ෂණික/ කාර්මික සබඳතා**

කාර්මික සබඳතා වශයෙන් විදුලිය සහ සන්නිවේදනය අවකාශීය සංවර්ධනයේදී ඉතා වැදගත් වේ. එමඟින් ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ අතර නව තොරතුරු හා අදහස් ගලායාම, නව තාක්‍ෂණික ක්‍රම ශිල්ප ගලායාම සිදුවන අතර ඒවා නවෝත්පාදනවලට හේතු වේ.

**සමාජ සබඳතා**

ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ සමාජ සම්බන්ධතා හරහා ද බැඳී පවතී. නාගරික මධ්‍යස්ථාන ග්‍රාමීය ජනතාවගේ විවිධ සමාජ අවශ්‍යතා ඉටුකර දෙනු ලබයි. ග්‍රාමීය ජනතාවගේ සංස්කෘතික උත්සව, ප්‍රතිමෝදක කටයුතු සඳහා ස්ථාන, ආගමික කටයුතු, ක්‍රීඩා, සංගීත සංදර්ශන, නාට්‍ය, චිත්‍රපට සහ මිතුරන් මුණ ගැසීම ආදී විවිධ සමාජ අවශ්‍යතා සඳහා ස්ථානය වන්නේ නගර හෝ නාගරික වෙළෙඳපොළ යි. මෙවැනි අවස්ථා මඟින් ජනතාවගේ සමාජීය කටයුතු වර්ධනය වන අතර බොහෝ විට තරුණ ජනතාවට මෙවැනි සබඳතා හරහා තම සහකරුවන් සොයා ගැනීමට අවස්ථාව ලැබේ. එමඟින් නව ඥාති සබඳතා ඇති වී ජීවිත කාලය පුරාම අන්තර් භූගෝලීය ප්‍රදේශ හරහා ගමන් කරන අතර මෙය ප්‍රදේශ අතර සබඳතා වර්ධනයට හේතු වේ. මෙමඟින් නගරයකට පැමිණෙන වාර ගණන වැඩිවන අතර එය වෙළෙඳ හා සේවා කටයුතු පුළුල් වීමට හා පුද්ගල සංචලතාවය ඇති වීමට හේතු වේ. තරුණ පුද්ගලයන්ට මෙම සම්බන්ධතා හරහා රැකියා සොයා ගැනීමට ද අවස්ථාව ලැබෙන අතර නාගරික අංශයේ රැකියාවක නිරත වීම නව අදහස් සහ ආකල්ප ඇති වීමටත්, සම්ප්‍රදායික සමාජ ව්‍යුහය බිඳ හරිමින් නව ආරක ජීවිතයකට පිවිසීමටත් හැකි වේ. එමෙන්ම නව අධ්‍යාපන අවස්ථා විවර වීම හා වෘත්තීය පුහුණුවීම්වලට යොමු වීමට අවස්ථාව ලැබීම ද වැදගත් වේ. Rondinelli & Ruddle (1978) පවසන පරිදි මිනිසුන්ගේ සමාජීය අවස්ථා වැඩිවීම යනු ඔවුන්ගේ චින්තනය, හැසිරීම සහ ආකල්ප වෙනස් වීම හරහා නව ජීවන රටාවක් ඇතිවීමයි.

**පාරිසරික සබඳතා**

පාරිසරික වශයෙන් ද මෙම ප්‍රදේශ අතර අන්තර් සබඳතාවයක් ඇති වේ. නාගරික ප්‍රදේශ සිය නීත්‍යානුකූල මායිම් හෝ සීමාවෙන් ඔබ්බට ප්‍රසාරණය වීමේදී (Urban sprawl) ග්‍රාමීය ව පවතින ස්වභාවික සම්පත්, එනම්, භූමිය, ජලය වැනි සම්පත් සඳහා ඉල්ලුමක් ඇති කරයි.

මෙලෙස ග්‍රාමීය නාගරික ප්‍රදේශවල දෛනිකව පවතින හුවමාරු ක්‍රියාවලිය මෙම ප්‍රදේශ දෙකට ම ප්‍රතිඵල ගෙන එනු ලබන බව ඉතා පැහැදිලි ය. මෙම ප්‍රදේශ අතර පවතින සම්බන්ධය නොමැතිව ග්‍රාමීය ප්‍රදේශ හෝ නාගරික ප්‍රදේශ වර්ධනය නොවේ. එබැවින් මෙම ප්‍රදේශ වෙන්කොට සැලකිය නොහැකි ය. අද ග්‍රාමීය ප්‍රදේශයක් ව පවතින ස්ථානයක් හෙට නගරයක් විය හැකි ය. මෙම ක්‍රියාවලිය ග්‍රාමීය ප්‍රදේශ නාගරික ප්‍රදේශවලට පරිවර්තනය කරන අතර සාම්ප්‍රදායික ජීවන රටාව කඩා බිඳ දමමින් නාගරික ජීවන රටාව ව්‍යාප්ත කිරීමට හේතු වේ. එබැවින් ප්‍රාදේශීය සැලැසුම්කරණයේදී මෙම ක්‍රියාවලිය මනාව අවබෝධ කොට ගත යුතුයි. කෙතරම් දුරට ග්‍රාමීය හා නාගරික ජනතාවගේ ආදායම් ග්‍රාමීය හා නාගරික අවස්ථා මත පදනම් වන්නේද, ග්‍රාමීය හා නාගරික ආර්ථිකයන් අතර පවතින බහුවිධ අන්තර් සම්බන්ධතා කවරේද, ගම් හා නගර කෙතරම් දුරට එකිනෙකාගේ ජීවිත වෙනස් කරන්නේද, යන්න පිළිබඳ ව ප්‍රාදේශීය සංවර්ධන සැලැසුම්කරණයේ දී විශේෂ අවධානය යොමු කළ යුතුය. සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල් තවමත් ප්‍රාදේශීය සංවර්ධන ප්‍රතිපත්ති සැකැසීමේ දී මෙම ප්‍රදේශ අතර පවතින ඒකාබද්ධතාවයට වැඩි අවධානයක් යොමු නොකරයි. මෙහි ප්‍රතිඵලය වන්නේ ජනතාව දරිද්‍රතාවයට ගොදුරු වීම හා බලාපොරොත්තු

නොවන ලෙස බාහිර සංක්‍රමණ ඇති වීම යි. එබැවින් ශ්‍රී ලංකාව වැනි කෘෂිකාර්මික පදනමක් ඇති සංවර්ධනය වන රටක ප්‍රාදේශීය සංවර්ධනයක දී පවතින මෙවැනි අන්තර් සබඳතා අවබෝධ කොට ගැනීම ඉතා වැදගත් වේ.

---

## සංවර්ධිත රටවල ග්‍රාමීය-නාගරික සබඳතා

ප්‍රාදේශීය සංවර්ධනය සඳහා නව ප්‍රවේශයක් වශයෙන් ග්‍රාමීය-නාගරික සබඳතා වර්ධනයට අවධානය යොමු කිරීමත් සමඟ ප්‍රාදේශීය සැලැසුම්කරණය කිරීමේ අරමුණින් විවිධ කලාපවල සහ රටවල පවතින ග්‍රාමීය-නාගරික සබඳතාවල ස්වභාවය හඳුනා ගැනීම සඳහා වන පර්යේෂණ වැඩි වී ඇත. එවැනි අධ්‍යයන ඇසුරින් ලබාගත් තොරතුරුවලට අනුව සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින කලාප/රටවල පවතින ග්‍රාමීය-නාගරික සබඳතා වගුව 02 හි දක්වා ඇත.

ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳ ව යුරෝපා රටවල කරන ලද පර්යේෂණවලට අනුව එම රටවල ග්‍රාමීය-නාගරික සබඳතා ඉතා ඉහළ මට්ටමක පවතී (Mushi, 2003). වර්තමානය වනවිට යුරෝපා රටවල මුලු ජනසංඛ්‍යාවෙන් 75% ක් පමණ නාගරික ප්‍රදේශවල වාසය කරයි. දෙවන ලෝක යුද්ධයෙන් පසු යුරෝපා කලාපයේ නාගරීකරණය හා කාර්මීකරණය බද්ධ වෙමින් ගමන් කළ අතර, එමඟින් කෘෂිකර්මාන්තය නවීකරණය වීම සේවා වියුක්ත කෘෂිකාර්මික ශ්‍රමිකයන්ගේ ගැටලුවලට ප්‍රබල විසඳුමක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානය වනවිට යුරෝපයේ  නාගරික ප්‍රදේශ හා ඒ ආශ්‍රිත පර්යන්ත ප්‍රදේශ අතර විවිධ හුවමාරු සබඳතා රාශියක් ගොඩනැගී තිබේ. කිසියම් ප්‍රදේශයක ආර්ථික සංවර්ධන මට්ටම අවකාශීය සබඳතාවල තීව්‍රතාවය සහ සංයුතිය තීරණය කරනු ලබයි. Kreibich & Tamakloe (1996) පවසන පරිදි නාගරික ප්‍රදේශ සහ තදාසන්න ග්‍රාමීය ප්‍රදේශ අතර ශක්තිමත් ආර්ථික සබඳතා පැවතීම ඉතා ප්‍රබල ගුණාකාර ඵල ඇති කරයි. Kunzmann & Wegener (1991) පවසන පරිදි යුරෝපා කලාපයේ සියලුම හර ප්‍රදේශ සිය තදාසන්න ප්‍රදේශ සමඟ මනාව සම්බන්ධ වී පවති. ඇමෙරිකා එක්සත් ජනපදයේ 2/3 ජනතාව ආයතන හා සේවා නගර පර්යන්ත ප්‍රදේශ තුළ ස්ථානගත වෙමින් පවතී. එබැවින් නගර පර්යන්ත රැකියා සහ සේවා සපයන ප්‍රමුඛ ස්ථාන බවට පත් ව ඇත (Mushi, 2003).

---

## සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය-නාගරික සබඳතා

සංවර්ධිත රටවලට වඩා වෙනස් වූ ග්‍රාමීය-නාගරික සබඳතා සංවර්ධනය වෙමින් පවතින ආසියා සහ අප්‍රිකා රටවල පවතින බව ඒ සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනවලින් හෙළි වේ. Dias (1991) පෙන්වා දෙන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකර්මාන්තය වාණිජකරණය වුවත් එය යුරෝපා කලාපයේ මෙන් ග්‍රාමීය භූමි පරිභෝගය වෙනස් කිරීමට තරම් දායක වී නැති බවයි. ඔහුට අනුව ඊට ප්‍රධාන හේතුව ආසියානු රටවල පුරවර ප්‍රදේශ වර්ධනය වන්නේ ඒවායේ තදාසන්න ග්‍රාමීය ප්‍රදේශ සමඟ බද්ධ වෙමින් නොවීමයි. නාගරික කර්මාන්ත දුරස්ථ පරිබාහිර ප්‍රදේශවලින් ගෙන එනු ලබන අමුද්‍රව්‍ය මත පදනම් වන අතර, නගර තුළ පවතින ලාභදායී ශ්‍රමය නිසා නව රැකියා උත්පාදනයෙන් ග්‍රාමීය අතිරික්ත ශ්‍රමය උරා ගැනීමට නොහැකි වන අතර, මේ තුළින් ග්‍රාමීය කෘෂි අංශයේ නවීකරණය ප්‍රමාද කරනු ලබයි. එබැවින්, තව දුරටත් ඔහු පෙන්වා දෙන පරිදි, ආංශීය සබඳතා, එනම්, ග්‍රාමීය කෘෂි අංශය සහ නාගරික කාර්මික අංශය අතර පවතින අන්තර් යැපීම දුර්වල මට්ටමක පවතී. ඒ අනුව ඔහු පවසන්නේ මෙම රටවල පුරවර සම්බන්ධ වන්නේ තදාසන්න ග්‍රාමීය ප්‍රදේශවලට වඩා ජාතික හෝ ජාත්‍යන්තර ආර්ථිකය සමඟ බව යි. McGee (1987) සහ Dias (1991) නිරීක්ෂණ අනුව සමහර ආසියානු රටවල ප්‍රාදේශීය ආර්ථිකයන් නිවැරදි සහ ශක්තිමත් ග්‍රාමීය-නාගරික සබඳතා නිසා වේගයෙන් වැඩෙන අතර, තවත් රටවල දුර්වල ග්‍රාමීය-නාගරික සබඳතා නිසා ප්‍රාදේශීය ආර්ථිකයන් ඉතා පසුගාමී වී ඇත. මෙහි දී

**වගුව අංක 02 :** විවිධ කලාප/රටවල ග්‍රාමීය-නාගරික සබඳතා

| රට/ කලාපය | ග්‍රාමීය-නාගරික සබඳතා | | | | | පර්යේෂකයා | |
|---|---|---|---|---|---|---|---|
| | ආර්ථිකය | ප්‍රජා විද්‍යාත්මක | භෞතික | තාක්ෂණික | ආයතනික | | |
| යුරෝපය | √ | √ | √ | √ | √ | Kunzmann &Wegener (1991) | |
| ඇමෙරිකාව | √ | √ | √ | √ | √ | Fishman (1991) | |
| ආසියාව | √ | √ | x | x | x | Dias (1990)<br>McGee  (1990) | |
| දකුණු අප්‍රිකාව | √ | √ | x | x | x | Smith   (1998) | (as cited by Mushi, 2003) |
| සිම්බාබ්වේ | √ | √ | x | x | x | Kamate  (1998) | |
| කෙන්යාව | √ | √ | x | x | x | Karaska (1998) | |
| දකුණු ටැන්සානියා | √ | √ | x | x | x | Mushi *et al.*  (2000) | |

√: ශක්තිමත් සබඳතා ගොඩනැගී ඇත. x : සබඳතා ගොඩනැගී නැත

මූලාශ්‍රය: Mushi, 2003

ඔවුන් මෙම පසුගාමී ආර්ථිකයන් කාර්යක්ෂම ආර්ථිකයන් කිරීමට ඉතා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස භාණ්ඩ සහ පුද්ගල සංචලතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රවාහනය සහ මාර්ග පද්ධතිය නවීකරණය කිරීම, ආර්ථික කටයුතු විවිධාංගීකරණය කිරීම, ශක්තිමත් හා සංවිධානාත්මක ආයතනමය ව්‍යුහයක් ඇති කිරීම අවශ්‍ය බව පෙන්වා දෙයි.

අප්‍රිකානු රටවල ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳ අධ්‍යයනවලින් පෙන්වා දෙන්නේ යටත් විජිතකරණයෙන් පසු ඇති වූ නගරවල කාර්මික පදනමක් නොමැති බැවින් කාර්මික යෙදවුම් සඳහා තදාසන්න ග්‍රාමීය ප්‍රදේශ සමඟ ශක්තිමත් සබඳතා ගොඩනැගී නැති බවයි. යටත් විජිතවාදී නාගරික පද්ධතිය විදේශිකයන්ගේ පරිපාලන කටයුතු හා ග්‍රාමීය කෘෂිකාර්මික සම්පත් රැස් කිරීම සඳහා ගොඩනැගුනකි. එහිදී දේශීය කෘෂිකාර්මික ද්‍රව්‍ය අධිරාජ්‍යයට ගලා ගිය අතර අධිරාජ්‍යයේ නිෂ්පාදිත භාණ්ඩ සඳහා යටත් විජිතය වෙළඳපොළ විය. මෙසේ ආනයනය කරන ලද නිමි භාණ්ඩ නිසා බොහෝ දේශීය සාම්ප්‍රදායික කර්මාන්ත කඩා වැටුණු අතර එය දේශීය රැකියා සහ දේශීය නාගරික පද්ධතිය දියකර හැරීමට හේතුවක් විය. මෙම තත්ත්වය අප්‍රිකාවට පමණක් නොව බොහෝ දකුණු ආසියාතික රටවලට ද අදාළ වන්නකි. දේශීය ව වැඩුණු බොහෝ නගර වර්තමානයේ දී පවා දුර්වල සහ මන්දගාමී ව වැඩෙන අතර ඒවායේ යටිතල පහසුකම් සහ සේවා පහසුකම් ද ඉතා අඩු මට්ටමක පවතී. යටත් විජිතකරණයේ බලපෑමට හසු වූ බොහෝ වෙරළබඩ නගර වර්තමානයේදී පවා සාපේක්ෂව වේගයෙන් වැඩේ.

දකුණු ටැන්සානියාවේ ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳව අධ්‍යයනයක යෙදෙන Mushi *et al.* (2000) පෙන්වා දෙන්නේ දකුණු ටැන්සානියාවේ ග්‍රාමීය-නාගරික සබඳතා දුර්වල කරන ප්‍රධානතම සාධකය වන්නේ එහි දුර්වල ප්‍රවාහන පද්ධතිය බව යි. භෞතික සබඳතා දුර්වල වීම අනෙකුත් සම්බන්ධතා දුර්වල කිරීමට බලපාන ප්‍රධානතම සාධකය වේ. ඔවුන් පෙන්වා දෙන පරිදි තැපැල් කාර්යාල මඟින් මුදල් යැවීම, අධ්‍යාපනික සහ සෞඛ්‍යය සේවා ලබා ගැනීම, රැකියා සොයා ගැනීම, කෘෂි ද්‍රව්‍යය අලෙවි කිරීම ආදිය මඟින් ග්‍රාමීය ජනතාව නාගරික ප්‍රදේශ සමඟ සම්බන්ධ වී ඇති අතර, ඍතුමය වශයෙන් කෘෂිකාර්මික රැකියා සොයා ගැනීම, නගරවල විකිණීම සඳහා කෘෂි ද්‍රව්‍ය රැගෙන ඒම ආදිය මගින් නාගරික පුද්ගලයින් ග්‍රාමීය ප්‍රදේශ සමඟ සම්බන්ධතා ගොඩ නගා ගෙන ඇති බව යි. මෙය වඩා ශක්තිමත් කිරීම සඳහා කාර්යක්ෂම ප්‍රවාහන ජාලයක අවශ්‍යතාව ඔහු අවධාරණය කරයි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය-නාගරික සබඳතාවල පසුබිම සහ පවතින ස්වභාවය පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් මෑත කාලීන ව කරන අධ්‍යයන කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් ය.

1950 න් පසු ශ්‍රී ලංකාවේ ජනාවාස පද්ධතියේ අසමතුලිතතාවය වඩාත් වර්ධනය වී ඇත. නිදහසින් පසු විශේෂයෙන් ම කොළඹ වර්ධනයට මූලිකත්වය දුන් රාජ්‍ය ප්‍රතිපත්ති මත වර්තමානය වන විට කොළඹ පුරවරය ශ්‍රී ලංකාවේ හරය බවට පත් වී අනෙකුත් බහුතර ග්‍රාමීය ප්‍රදේශ මන්දගාමී පර්යන්ත ප්‍රදේශ ලෙස පවතී. එහෙත් මෙම මන්දගාමී පර්යන්ත ප්‍රදේශවල වර්ධනය වේගවත් කිරීමට දායක කරගත හැකි කුඩා සහ මධ්‍යම ප්‍රමාණ නගර රාශියක් ද පිහිටා තිබේ. ශ්‍රී ලංකාවේ නාගරික පද්ධතියේ නගරවලින් 75% ක් ම කුඩා සහ මධ්‍යම ප්‍රමාණ නගරයන් ය. මෙම නගර සහ තදාසන්න ප්‍රදේශ අතර හුවමාරු සබඳතා ශක්තිමත් කිරීම එම ප්‍රදේශවල වර්ධනයට බෙහෙවින් උපකාරි වේ.

බස්නාහිර පළාත හැරුණුකොට ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත් කෘෂිකාර්මික පදනම මත වැඩෙන පළාත් වේ. Wanasinghe (2001) හඳුන්වන පරිදි මන්දගාමී පර්යන්තයේ තිබෙන ඌව, සබරගමුව සහ උතුරු මැද පළාත්වල ප්‍රාදේශීය ආර්ථිකයට ඇති කෘෂිකාර්මික දායකත්වය ඉතා ඉහළ ය. Amarasinghe (2000) පෙන්වා දෙන්නේ මොණරාගල දිස්ත්‍රික්කය අතිරික්ත නිෂ්පාදනයක් සහිත ග්‍රාමීය ප්‍රදේශයක් වුවද එම නිෂ්පාදනය ප්‍රදේශයෙන් පිටතට යොමු වූ වෙළඳ සබඳතා හරහා පිටතට ගලා යාම නිරීක්ෂණය කළ හැකි බව යි. මෙලෙස නිෂ්පාදන පිටතට ගැලීමට ප්‍රධානතම හේතුව ලෙස ඔහු පෙන්වා දෙන්නේ මොණරාගල දිස්ත්‍රික්කයේ අවකාශීය වශයෙන් ඒකාබද්ධ වූ ශක්තිමත් නාගරික ධුරාවලියක් නොමැති වීම යි. නිෂ්පාදන අතිරික්තය පිටතට ගැලීම තුළින් මූල්‍යමය හා අනෙකුත් සම්පත් ගලා ඒම වාසිදායක වුවද මෙහි පවතින ගැටලුව වන්නේ ප්‍රදේශයේ නාගරික මධ්‍යස්ථාන ශක්තිමත් නොවීම තුළ අතරමැදි ග්‍රහණයට නිෂ්පාදකයන් හසුවීම නිසා ඔවුන් ලබන ආදායම අඩුවීම මත අතිරික්ත නිෂ්පාදනය සඳහා කරනු ලබන ආයෝජන දුර්වල වීමයි. මොණරාගල දිස්ත්‍රික්කයේ බොහෝ නාගරික ලක්ෂණ සහිත ප්‍රදේශ නාගරික ස්ථාන ලෙස පිළිගෙන නැත. එබැවින් මෙම නාගරික ලක්ෂණ සහිත ප්‍රදේශ ක්‍රමවත් ආකාරයට වර්ධනය නොවන අතර ජාතික නාගරික පද්ධතිය හා සම්බන්ධ නොවන මන්දගාමී නගර ලෙස පවතී. මොණරාගල වැනි කෘෂිකර්මය මත පදනම් වූ දිස්ත්‍රික්කයක අවකාශීය ව බද්ධ වන කාර්යක්ෂම නාගරික පද්ධතියක් පැවතීම ග්‍රාමීය-නාගරික සබඳතා තීව්‍ර කිරීමටත්, එමඟින් කෘෂි වාණිජකරණය හරහා ද්විතීයික අංශයට මාරු වීමටත් අනුබල දෙයි. කාර්යක්ෂම නගර මඟින් කෘෂිකර්මය සඳහා නව යෙදවුම්, නවීන තාක්ෂණික උපදෙස් සහ තොරතුරු මෙන්ම නවීන යන්ත්‍රෝපකරණ ද අවට ග්‍රාමීය ජනතාවට ලබාගත හැකි ය. එමඟින් සාම්ප්‍රදායික හෝ යල් පැන ගිය නිෂ්පාදන ක්‍රමවේද වෙනස් කිරීමට හැකිවන අතර වැඩි නිමැවුමක් ඇති වීමෙන් ගොවීන්ගේ වෙළෙඳ පොළ සබඳතා සහ ගනුදෙනු ප්‍රසාරණය වේ. සාමප්‍රදායික ක්‍රමවේද මත කෙරෙන නිෂ්පාදනයට ගුණාත්මකව මෙන්ම ප්‍රමාණාත්මකව ද විවෘත වෙළෙඳ පොළේ තරඟ කිරීමට අපහසු ය. එමෙන්ම, නිෂ්පාදනය විවිධාංගීකරණය වීම ආර්ථික වර්ධනයට අත්‍යවශ්‍ය අංගයකි. එහෙත් දුර්වල නාගරික පද්ධතියක් පැවැතීම නිෂ්පාදනය විවිධාංගීකරණය වළකාලන අතර එය ආදායම සීමා වීමටත්, ආදායම සීමා වීම ආයෝජන සීමා වීමටත් හේතු වේ.

යම් ප්‍රදේශයක නිෂ්පාදනය කෙරෙහි දුර්වල ග්‍රාමීය-නාගරික සබඳතා ඍජු ලෙස බලපෑම් කරන අතර එය පාරිභෝජනය කෙරෙහි ද අහිතකර ලෙස බලපානු ලැබේ. අඩු නිෂ්පාදනය ක්‍රය ශක්තිය අඩු කිරීමට හේතුවන අතර ක්‍රය ශක්තිය දුර්වල වීම නිසා භාණ්ඩ හා සේවාවලට තිබෙන ඉල්ලුම සීමා වේ. Amarasinghe (2000) පවසන පරිදි මොණරාගල වැනි ග්‍රාමීය

ප්‍රදේශවල බොහෝ කඩ සාප්පු අවම පර්යන්ත ජන සංඛ්‍යාවක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.

Ratnayake (2007) විසින් ඉඩම් අයිතිය, වෙළඳ පොළ සහ ශ්‍රම භාවිතය යන අංශ හරහා ග්‍රාමීය-නාගරික සබඳතා පිළිබඳව උතුරු මැද පළාතේ තෝරාගත් නාගරික මධ්‍යස්ථාන කිහිපයක කරන ලද පර්යේෂණයන්ට අනුව නිගමනය කරන එක් කරුණක් වන්නේ, ම නාගරික මධ්‍යස්ථානවල පර්යන්ත ප්‍රදේශයේ ගොවියාගේ ආර්ථිකය කෙරෙහි ග්‍රාමීය-නාගරික සබඳතා එතරම් වැදගත් නොවන බවයි. මූලික වශයෙන්ම වී වගාව පදනම් කොට ගත් ආර්ථිකයක් ඇති උතුරු මැද පළාතේ ගොවීන් යෙදවුම් ලබා ගැනීමේදී සහ නිමැවුම් අලෙවියේ දී යම් සීමාවන්ට කොටු වී ඇත. එනම්, ගොවීන් ණය පදනම මත තම කෘෂි යෙදවුම් ලබා ගන්නා අතර තම කෘෂි නිමවුම ණය පදනම මත කෘෂි යෙදවුම් ලබා දුන් පුද්ගලයාට විකිණීමට බැඳී සිටී. එබැවින් උතුරු මැද පළාතේ ග්‍රාමීය-නාගරික සබඳතා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේදී ධනාත්මක සාධකයක් නොවන බව පෙන්වා දී ඇත. එමෙන්ම ඔහු පෙන්වා දෙන තවත් කරුණක් වන්නේ උතුරු මැද පළාතේ ග්‍රාමීය ජනතාව අමතර ආදායම් ඉපයීම සඳහා එම පළාතේ කුඩා නගර සමඟ සම්බන්ධවනවාට වඩා කොළඹ, කුරුණෑගල වැනි පිටස්තර විශාල නගර සමඟ ධනාත්මක ලෙස සම්බන්ධවන බව යි. මෙමගින් ගම්‍ය වන්නේ උතුරු මැද පළාතේ නගර පර්යන්ත ප්‍රදේශවල ශ්‍රමය උරා ගැනීම සඳහා රැකියා ජනනයට අසමත් නගර බව යි. ප්‍රාදේශීය ආර්ථික වර්ධනයේදී මෙය සෘණාත්මක සාධකය කි.

සබරගමුව පළාතේ තෝරා ගන්නා ලද නගර කිහිපයක, එනම්, මාවනැල්ල, රඹුක්කන, සහ පැල්මඩුල්ල යන නාගරික මධ්‍යස්ථාන සහ ඒවායේ පර්යන්ත ප්‍රදේශ අතර ගොඩ නැඟී ඇති සබඳතා පිළිබඳ ව අධ්‍යයනය කරන Uduporuwa (2005) නිගමනය කරන්නේ වතු කෘෂිකාර්මික පදනමක් ඇති මෙම පළාතෙහි ග්‍රාමීය-නාගරික සබඳතා තවමත් ප්‍රාථමික අවස්ථාවෙහි පවතින බව යි. මෙයට එක් ප්‍රධාන හේතුවක් ලෙස පෙන්වා දී ඇත්තේ පර්යන්ත ප්‍රදේශයේ ජනතාවගේ අඩු ක්‍රය ශක්තිය නිසා නාගරික භාණ්ඩ හා සේවාවලට තිබෙන ඉල්ලුම සීමා වීම යි. එමෙන්ම, මෙම නගර හුදෙක්ම පර්යන්ත ප්‍රදේශයේ ජනතාවට සේවා සපයන සේවා මධ්‍යස්ථාන විනා කාර්මික පදනම මත වැඩෙමින් රැකියා ජනනය කරන නගර නොවේ. පර්යන්ත ප්‍රදේශයෙන් සැලැකිය යුතු ප්‍රතිශතයන් වෙනත් පළාත්වල ප්‍රධාන නගරවල එනම්, මහනුවර, කොළඹ, කුරුණෑගල වැනි නගරවල රැකියාව කරනු ලබයි. එමෙන්ම කඳුකර භූ දර්ශනයක් සහිත සබරගමුව පළාතේ D සහ E ශ්‍රේණියේ මාර්ග ඉතා දුර්වල තත්ත්වයක පැවැතීම නිසා පවතින ප්‍රවාහන අපහසුතා ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ අතර ද්‍රව්‍ය හා පුද්ගල සංචලතාවය කෙරෙහි සීමාකාරී සාධකයක් ලෙස බලපානු ලැබේ.

Amarasinghe (2000) සහ Uduporuwa (2005) පෙන්වාදී ඇති ආකාරයට ශ්‍රී ලංකාවේ දුර්වල භෞතික සබඳතා දුර්වල ආර්ථික හා සමාජ සබඳතාවලට හේතු වේ. අකාර්යක්ෂම මාර්ග පද්ධතිය මොණරාගල, රත්නපුර, කෑගල්ල වැනි ග්‍රාමීය දිස්ත්‍රික්කවල ග්‍රාමීය-නාගරික සබඳතා දුර්වල කිරීමට සෘජු ලෙස බලපාන ප්‍රධාන සාධකයක් වේ. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කරමින් ග්‍රාමීය-නාගරික සුමගතාව වැඩි කිරීම අරඹා තිබීම ග්‍රාමීය-නාගරික සබඳතා ශක්තිමත් කිරීම සඳහා ධනාත්මක ලෙස බලපාන ප්‍රධාන සාධකය කි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර සම්බන්ධ කරන A, B සහ C ශ්‍රේණියේ මාර්ග නවීකරණය කර ඇතත් බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල වාහන ගමනාගමනයට අපහසු, පටු මෙන්ම, දීර්ඝ කාලයක් තිස්සේ නඩත්තු නොකළ මාර්ග පවතින අතර ඒවායේ මතුපිට පෘෂ්ඨය දුර්වල ව පවතී. සබරගමුව පළාතේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ගවල මෙම තත්ත්වය පවතින බව නිරීක්ෂණය කළ හැක. මෙම පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ නාගරික මධ්‍යස්ථානවල පර්යන්ත ප්‍රදේශයේ ජනතාව නගර කරා තම නිෂ්පාදන දෙවුර මතින් ගෙන යනු ලබන අතර, ඊට අමතරව අත් ට්‍රැක්ටර්, කරත්ත වැනි සැහැල්ලු වාහන භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගනී. ප්‍රවාහන පිරිවැය ඉහළ යාමට මෙම ප්‍රදේශවල පවතින දුර්වල මාර්ග හේතුවන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කෘෂි නිෂ්පාදන එකතු කිරීම සඳහා ගමට පැමිණෙන ජංගම වෙළෙඳුන්ට ගොවීන් තම නිෂ්පාදන අඩු මිළකට විකිණීම පොදු සංසිද්ධියක් බවට පත්වී ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ එක් පසෙකින් ග්‍රාමීය ගොවීන්ට නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොලැබීම සහ අනෙක් පසින් සිය නිෂ්පාදන අලෙවියේදී නාගරික වෙළඳ පොළ සමඟ සෘජු සම්බන්ධතා ගොඩ නැංවීමක් සිදු නොවීමයි.

## ග්‍රාමීය නාගරික සබඳතා හි නව ප්‍රවණතා

පසුගිය කාල පරිච්ජේදය තුළ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල කරන ලද පර්යේෂණයන්ට අනුව ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල ග්‍රාමීය-නාගරික සබඳතා දුර්වල මට්ටමක පැවැතිය ද, වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ග්‍රාමීය-නාගරික සබඳතා ශක්තිමත් කරන නව ප්‍රවණතා රැසක් බිහිවෙමින් පවතී. එනම්, වර්තමානය වන විට රාජ්‍ය දායකත්වය යටතේ අරම්භ කොට ඇති මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය-නාගරික සබඳතාවලට ඉතා සුභවාදී ලෙස බලපානු ලබයි. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ ඒකාබද්ධ කරමින් අධිවේගී මාර්ග ජාලයක් ඉදිකිරීම, ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කරමින් ග්‍රාමීය-නාගරික සුගමතාවය වැඩි කිරීම, නව වර්ධන ධ්‍රැවයක් ලෙස හම්බන්තොට සංවර්ධනය කිරීම යන කාරණා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය-නාගරික සබඳතා ශක්තිමත් කිරීම කෙරෙහි සෘජු ලෙස බලපානු ලබන සාධකයන් වේ. විශේෂයෙන් ම මෙම ව්‍යාපෘති මඟින් නාගරික ප්‍රදේශවලින් දුරස්ථ ග්‍රාමීය ප්‍රදේශ භෞතික සහ සමාජීය යටිතල පහසුකම් සහ රැකියා ජනනය යන අංශවලින් බල ගැන්වෙන අතර, එමඟින් ජාතික සහ ප්‍රාදේශීය නාගරික මධ්‍යස්ථාන සමඟ නව සබඳතා රාශියක් ඇති වීමට ඉඩ සැලැසේ. විශේෂයෙන් ම හම්බන්තොට නව වර්ධන ධ්‍රැවයක් ලෙස ගොඩ නැගීම මොණරාගල සහ ඇඹිලිපිටිය වැනි කෘෂිකාර්මික සම්පත්වලින් පොහොසත් එහෙත් දුර්වල ග්‍රාමීය-නාගරික සබඳතා සහිත ප්‍රදේශවල සියලු ග්‍රාමීය-නාගරික සබඳතා ශක්තිමත් කිරීමට බලපානු ඇත. හම්බන්තොට ඉදිකොට ඇති අන්තර් ජාතික වරාය සහ ගුවන් තොටුපොල මූලික කොට ගෙන එම ප්‍රදේශවලට සංකේන්ද්‍රණය වන ජනසංඛ්‍යාවට අවශ්‍ය ආහාර සපයනු ලබන ප්‍රධාන ප්‍රදේශ වන්නේ ද මොණරාගල සහ ඇඹිලිපිටිය

වැනි ප්‍රදේශයන් ය. මේ සඳහා දැනට ක්‍රියාත්මක ග්‍රාමීය නාගරික මාර්ග ප්‍රතිසංස්කරණ වැඩ සටහන ද ඉතා වැදගත් වේ. මේ තුළින් ග්‍රාමීය මාර්ග වන C, D සහ E ශ්‍රේණිවල මාර්ග සංවර්ධනය වන අතර එමගින් එම ප්‍රදේශවල භෞතික සබඳතා ශක්තිමත් වනු ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය-නාගරික සබඳතා ශක්තිමත් කිරීම කෙරෙහි රාජ්‍යය අංශයේ දායකත්වය ට අමතරව පුද්ගලික අංශයේ දායකත්වය ද බල පා ඇත. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුපිරි වෙළෙඳසැල් දාම (Chain Supermarkets), ග්‍රාමීය-නාගරික සබඳතා ශක්තිමත් කරන සාධකයක් වී ඇත. ඔවුන්ගේ වෙළෙඳ ප්‍රතිපත්තියට අනුව නැවුම් නිෂ්පාදන පාරිභෝගිකයාට ලබා දීම සඳහා ගොවියා ළඟට ම ගොස් කෘෂි නිෂ්පාදන එකතු කරනු ලබයි. ඔවුන් විසින් ග්‍රාමීය කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථාන ග්‍රාමීය ප්‍රදේශ තුළ පිහිටුවා ඇති අතර එමගින් කුඩා පරිමාණ ගොවීන්ට සිය නිෂ්පාදන ප්‍රවාහන පිරිවැයකින් තොරව අලෙවි කර ගැනීමේ අවස්ථාව උදා වන අතර, නැවත ආයෝජනය සඳහා එය දිරි ගැන්වීමක් ද වේ. මෙලෙස ග්‍රාමීය-නාගරික සබඳතා සම්බන්ධ ව ඇති වී තිබෙන නව ප්‍රවණතා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සුභ ලකුණු වේ.

## නිගමනය

ව්‍යුහාත්මක ලක්ෂණ අනුව ගම් සහ නගර වෙනස් වුව ද එකිනෙකෙහි වර්ධනයේදී ඒවා එකිනෙකට පරායත්ත වන බව ඉතා පැහැදිලි ය. මෙම පරායත්තභාවයේ ස්වභාවය මනාව අවබෝධ කර ගත යුතු වන අතර එය අවබෝධ කර නොගැනීම ගම් සහ නගර අතර පරතරය වැඩි කිරීමට හේතු වේ. වර්තමානයේ ගෝලීයකරණය හරහා මෙම ප්‍රදේශ වඩ වඩාත් සමීප වෙමින් පවතින බැවින් ප්‍රාදේශීය සංවර්ධනයේදී තවදුරටත් නාගරික කේන්ද්‍රිත හෝ ග්‍රාමීය කේන්ද්‍රිත ප්‍රවේශ අදාළ නොවන අතර මෙම ප්‍රදේශ දෙකෙහි ම වර්ධනයට දායකවන ප්‍රවේශයක් ලෙස ග්‍රාමීය-නාගරික සබඳතා ශක්තිමත් කිරීම කෙරෙහි වඩාත් අවධානයක් යොමු කිරීම අත්‍යාවශ්‍ය ය. සංවර්ධිත රටවල ඉහළ නාගරීකරණය සහ වාණිජකරණය වඩාත් ප්‍රබල ග්‍රාමීය-නාගරික සබඳතා ඇති කිරීම කෙරෙහි බල පා ඇති අතර, කෘෂි පදනමක් ඇති සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය-නාගරික සබඳතා ප්‍රබල නොවීම සමාජ, ආර්ථික සහ දේශපාලනික වශයෙන් වූ හේතු රාශියක ප්‍රතිඵලය කි. ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම ප්‍රමාණ නගර විශාල ප්‍රමාණයක් පවතින නමුදු මෙම නගර සහ ඒවායේ පර්යන්ත ප්‍රදේශ අතර ශක්තිමත් සබඳතාවයක් ඇති නොවීම කෙරෙහි මූලිකව ම අවකාශය වශයෙන් ඒකාබද්ධ වූ නාගරික ධූරාවලියක් ස්ථාපිත වී නොතිබීම, නාගරික කාර්මික ආර්ථික පදනම ශක්තිමත් නොවීම නිසා රැකියා ජනනයට අවස්ථා නොතිබීම, දුර්වල ග්‍රාමීය මාර්ග නිසා සුගමතාවය අඩුවීම, පර්යන්ත ප්‍රදේශවල ජනතාවගේ අඩු ක්‍රය ශක්තිය නිසා නාගරික භාණ්ඩ හා සේවාවලට තිබෙන ඉල්ලුම සීමා වීම සහ තාක්ෂණික සහ ආයතනික සබඳතා ශක්තිමත් නොවීම බලපා ඇති බව පැහැදිලි ය. එහෙත් වර්තමානයේ දී, මෙම ප්‍රවණතාව වෙනස් කරමින් රාජ්‍යය සහ පුද්ගලික අංශයේ දායකත්වයෙන් අරඹා ඇති නව සංවර්ධන ව්‍යාපෘති සහ වෙළෙඳ ප්‍රතිපත්ති ග්‍රාමීය-නාගරික සබඳතා බලගැන්වීම සඳහා වැඩදායී වන අතර එම නව ප්‍රවණතා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ.

## REFERENCES


Amarasinghe, D. P. (2000) Rural urban linkage in Monaragala: some hypothesis, *Journal of Urban Development in Sri Lanka,* 1(1), pp: 20-28.

Bhooshan, B. S. (1986) Bangalore, Mandya and Mysore districts. In: J.E. Hardoy and D. Satterthwaite, eds. *Small and intermediate urban centers: their role in regional and national development in the third world*, Chichester and Westview: John Wiley.

Bryceson, D. F. & Jamal V. (eds) (1997) *Farewell to farms: de-agrarianisation and employment in Africa,* Africa Studies Centre Leidan, Research Series 1997/10, Aldershot: Ashgate.

Christaller, W. (1933) *Central Place Theory in Southern Germany,* trans. by C. W. Baskin (1966) Englewood Cliffs, New Jersey: Prentice Hall.

Dias, H. (1991) Agricultural change and transformation of urban-rural linkages in Asia, *Regional Development Dialog,* 11(2).

Douglas, M. (1998) A regional network strategy for reciprocal rural-urban linkages: an agency for policy research with reference to Indonesia, *Third World Planning Review,* 1(20).
DOI: http://dx.doi.org/10.3828/twpr.20.1.f2827602h503k5j6

Escobar, A. (1995) *Encountering development: the making and unmaking of the Third World studies in culture/power/history,* Princeton: Princeton University Press.

Friedmann, J. & Douglas, M. (1978) Agropolitan development: towards a new strategy for regional planning in Asia, in F. Lo and K. Salih (eds) *Growth pole strategy and regional development policy,* Pregamon Press.
DOI: http://dx.doi.org/10.1016/B978-0-08-021984-4.50014-9

Friedmann, J. (1966) *Regional development policy: a case study on Venezuela*, London: M. I. T. Press.

Hagerstrand, T. (1953) *Innovation diffusion as a spatial process*, trans. by A. Pred (1967) Chicago: University of Chicago Press.

Hardoy, J. E. & Satterthwaite, D. (1986) Government policies and small and intermediate urban centres in Hardoy. In J.E. Harody and D. Satterthwaite eds. *Small and intermediate urban centers: their role in national and regional development in the third world,* London and Westview: Hodder and Stoughton.

Hirschman, A. O. (1958) *The strategy for economic development,* New Hevan: Yale University Press.

Jefferson, M. (1931) The distribution of the world's city folk: a study in comparative civilization, *Geographical Review,* 22, pp: 453.
DOI: http://dx.doi.org/10.2307/209432

Johnson, E. A. J. (1970) *The organization of space in developing countries,* London: Harvard University Press.
DOI: http://dx.doi.org/10.4159/harvard.9780674499256

Kaur, R. (1995) *Urban-rural relations: a geographical analysis,* New Delhi: Anmol Publication.

Kreibich, V. & Tamakloe, T. (1996) The growth impact of Accra, an analysis of the rural -urban fringe and the linkages in the Northeastern Colorado of the Greater Accra region, *Spring Research Series,* No 17. Spring Center, University of Dormund.

Kunzmann, K. & Wegener, M. (1991) T*he pattern of urbanization of Western Europe: report for the directorate general XVI of the commission of the Europe communities,* Institute for Ranmplanung, University of Dormund.

Mangiza-Mutizwa, N. (1999) Strengthening Rural-Urban Linkages, *Habitat Debate*, 5(1) [online] Available at: < http://www.nzdl.org/gsdlmod?e=d-00000-00---off-0cdl--00-0----0-10-0---0---0direct-10---4-------0-1l--11-en-50---20-about---00-0-1-00-0--4----0-0-11-10-0utfZz-8-10&cl=CL1.108&d=HASH01c241189d48d76315c6ac61&gt=2> [Accessed January 2011].

McGee, T. (1987) The urban transition in Asia: emergence of new economic interactions of Asia, Paper prepared for Only One Earth Forum, New York, Rene Dubos Center for Human Settlement.

Mushi, N. S., Lerise, F., Kibadu, A. & Mbutolwe, E. (2000) *Rural Urban interaction and livelihood strategies: the case of Lindi region, Southern Tanzania*, London: IIED.

Mushi, N. S. (2003) R*egional development through rural urban linkages: the Dar-es Saalam impact region*, [online] Available at: < https://eldorado. tudortmund.de/bistream/2003/2862/1/Mushiunt.pdf > [Accessed January 2001].

Myrdal, G. (1957) *Economic theory and underdeveloped regions*, London: Duckworth.

Okpala, Don. C. I. (2003) *Promoting the positive rural-urban linkages approach to sustainable development and employment creation: the role of UN-HABITAT*, Monitoring and Research Division, United Nation Human Settlements Programme.

Perroux, F. (1950) Economic space: theory and applications, *Quarterly Journal of Economics,* 64(1), pp: 89-104.
DOI: http://dx.doi.org/10.2307/1881960

Ratnayake, R. M. K. (2007) *Rural-urban linkage in regional development: the experience of North Central Sri Lanka,* Malambe, Piyasiri Printers.

Rondinelli, D. & Ruddle, K. (1978) *Urbanization and rural development: a spatial policy for equitable growth*, New York: Praeger Publisher Special Studies.

Rondinelli, D. (1982) The potential of secondary cities in facilitating rural decentralised urbanization in Africa, *African Urban Studies,* No. 13, Spring.

Rondinelli, D. (1983) *Applied method of regional planning: the urban function in rural development approach*, Worcester: Clark University.

Rondinelli, D. (1984a) Editorial comment, *Regional Development Dialog,* 5(1).

Rondinelli, D. (1984b) Cities, market towns and agricultural development: regional perspectives, *Regional Development Dialog,* 5(1).

Rondinelli, D. (1985) *Applied method of relational analysis: the spatial dimension of spatial policy,* Colorado: West View Press.

Saint, W. S. & Goldsmith W. D. (1980) Cropping systems, structural change and rural- urban migration in Brazil, *World Development,* Vol.8.
DOI: http://dx.doi.org/10.1016/0305-750X(80)90013-3

Sauthall, A. (eds) (1979) *Small urban centers in rural development in African studies program*, Madison: University of Wisconsin.

Uduporuwa, R. J. M. (2005) *Strengthening small and medium size service centers in regional development in the Sabaragamuwa province*, Unpublished M. Phil Thesis, Faculty of Graduate Studies, University of Kelaniya, Sri Lanka.

von Thūnen, J. H. (1866) *von Thūnen's isolated state,* trans. by Carla M.Wattenburg, London: Oxford University Press.

Wanasinghe, Y. A. D. S. (2001) Regional imbalances in Sri Lanka: a critique of regional development policies and strategies, in: M. M. Karunanayake eds. *People, space and resources : perspectives on development issues in Sri Lanka,* Department of Geography, University of Sri Jayewardenepura - Sida/ SAREC Research Cooperation Project.